# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 මැයි මස 23 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 51/74.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— — ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන පනතේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මේ පනත යටතේ දායක මුදල් ගෙවීමට යටත් වීමෙන් ඇතැම් පුද්ගලයන් නිදහස් කිරීම.

10. පවුලක ප්‍රධානයා වූ හෝ පවුලකට ඇතුළත් නැති පුද්ගලයකු—

(අ) 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට—

(i) ඔහුගේ දායක මුදල් ගෙවිය යුතු ආදායමට සමාන බදු අය කළ හැකි ආදායමක් වෙනුවෙන් එම තක්සේරු වර්ෂය සඳහා ප්‍රධාන පනත යටතේ ගෙවීමට යටත් වන ආදායම් බද්ද රුපියල් අටසිය හතළිහකට වැඩි නොවේ නම් ; හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා ලැබූ ඔහුගේ මුළු ආදායම රුපියල් දොළොස් දහසකට වැඩි නොවේ නම්

එම තක්සේරු වර්ෂය සඳහා ද

2—ඒ 13047—11,883 (75/03)

(ආ) 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට, එම තක්සේරු වර්ෂය සඳහා ලැබූ ඔහුගේ මුළු ආදායම රුපියල් දහ අට දහසකට වැඩි නොවේ නම් එම තක්සේරු වර්ෂය සඳහා ද

මේ පනත යටතේ දායක මුදල් ගෙවීමට ඒ පුද්ගලයාට නියම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් එම වගන්තිය නැවත අංක කිරීමෙන් ;

(ආ) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) පවුලක ප්‍රධානයා වූ හෝ පවුලකට ඇතුළත් නැති පුද්ගලයකු විසින් 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මෙම පනත යටතේ ගෙවිය යුතු සාමාන්‍ය දායක මුදල, එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මුළු ආදායම රුපියල් දහ අට දහස ඉක්මවන්නේ යම් මුදලකින් ද ඒ මුදලෙන් සියයට අසූවකට වැඩි නොවිය යුතු ය.".